14.7.2019. පිටුව 1,6




# මේ වසර මුල් කාර්තුවේ ආර්ථිකය 3.7%කින් නඟී

ජයසිරි මුණසිංහ

වසර 2018 අවසන් කාර්තුවේ 1.8%ක් වූ මෙරට ආර්ථික වර්ධන වේගය මේ වසරේ මුල් කාර්තුවේදී 3.7%කින් වර්ධනය වී ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශ කරයි. ඉකුත් අප්‍රේල් 21 දා එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් පසු පසුබෑ සංචාරක හා සෙසු අංශ ආර්ථික ක්‍රියාකාරකම් මේ වන විට ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වෙමින් තිබෙන බවද මහ බැංකුව සඳහන් කරයි.

විශේෂයෙන්ම රටේ ආර්ථිකයේ සෑම අංශයක්ම යළි නඟාසිටුවීම සඳහා රජය විසින් විවිධ ණය මුදල්, බදු සහන සහ අනෙකුත් ප්‍රතිලාභ සුළු හා මධ්‍ය පරිමාණ, මහා පරිමාණ ව්‍යවසායකයන්ට සලසනු ලැබීය. ඒ අනුව පාස්කු දා ප්‍රහාරයෙන් බිඳවැටුණු ව්‍යාපාර යළි ශක්තිමත්ව නැඟී සිටීමට මේ වන විට මුල පුරා තිබේ. 6 වැනි පිටුවට

## මේ වසර... 1 වැනි පිටුවෙන්

රජය සංචාරක ක්ෂේත්‍රයේ නවෝදය සඳහා විවිධ ණය වැඩසටහන් හා ප්‍රතිලාභ යෝජනා ක්‍රම ගණනාවක් ක්‍රියාත්මක කළ අතර, ඉන් ප්‍රතිලාභ අත් කරගැනීමට 3500කට අධික පිරිසක් ඉල්ලුම් කොට තිබේ. ඒ අතුරින් 900 දෙනකුට අරමුදල් දැනටමත් සපයා ඇත.